**පෝරතිවු පත්තු ප්‍රාදේශීය සභාව**

**------------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 01 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මතය**

**-------**

මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පෝරතිවු පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2. මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.2,565,666 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 1,013,784 ක් වූ හෙයින් ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචන වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු 3,579,450 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් කළමනාකරණය**

**----------------------------**

**2.2.1 වරිපනම්**

**----------**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ස්ථානවල පිහිටි ඉඩම් සහ ඉදි කර ඇති නිවාස ගොඩනැගිලි යනාදිය වෙනුවෙන් 2015 වර්ෂය තුළ වරිපනම් ගණනය කර ඒවා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

සභාවේ සේවය කොට ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය කර ගත යුතු රු. 501,868 ක් වූ සේවක ණය හිග මුදල අවුරුදු පහකට වැඩි කාලයක් තිස්සේ ශේෂයක් වශයෙන් තිබුණත් එම මුදල් ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අය කර ගැනිමට 2016 මැයි 06 දින දක්වා කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය